# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2297/57 - 2022 සැප්තැම්බර් මස 15 වැනි බ්‍රහස්පතින්දා - 2022.09.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය - IR/COM/01/2017/101.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2019.04.03 දිනැති හා අංක 2117/31 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.03.26 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් බත්තරමුල්ල, තලංගම උතුර, කොස්වත්ත, පයිප්ප පාර, අංක 368/7 හි පදිංචි ඩී. වසන්ත ජයසිංහ මහතා සහ රත්මලාන, ගාලු පාර හි පිහිටි ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.08.14 දිනැති ප්‍රදානය එම පනතේ 18 (1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 සැප්තැම්බර් මස 06 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව.
කොළඹ 05.

බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.

නඩු අංකය : A/45/2019

ඩී. වසන්ත ජයසිංහ,
අංක 368/7, පයිප්ප පාර,
කොස්වත්ත,
තලංගම උතුර,
බත්තරමුල්ල.

IR/COM/01/2017/101

හා

ජාතික ජලසම්පාදන හා ජලාපවහන
මණ්ඩලය, ගාලු පාර,
රත්මලාන.


1A - G 37489 — 20 (2022/09)


මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ප්‍රදානයයි

1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත් වල 131 පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් කම්කරු හා වෘත්තීය සබඳතා අමාත්‍යවරයාට පැවරී ඇති බලතල අනුව අමාත්‍යවරයා විසින් ඉහත නම් සඳහන් පාර්ශවකරුවන් අතර වූ කාර්මික ආරවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරුවෙකු ලෙස 2019.03.26 වැනි දින මා පත් කරන ලදී.

කම්කරු කොමසාරිස්වරයා විසින් IR/COM/01/2017/101 හා 2019.03.14 වැනි දින යටතේ ගොනු කරන ලද ලේඛනය අනුව,

ඉහත සඳහන් පාර්ශ්වකරුවන් අතර ඇති ආරවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

ඩී. වසන්ත ජයසිංහ මහතාට ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කොන්ත්‍රාත් සේවකයෙකු ලෙස රාජකාරී ඉටු කිරීමට පත් කර ඔහුගෙන් ස්ථිර සේවකයන් ඉටුකරන රාජකාරී ලබා ගත්ත ද, ස්ථිර සේවකයන්ට ලැබෙන වරප්‍රසාද ලබා නොදීම තුළින් අසාධාරණයක් සිදුව තිබේ ද? එසේ සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද? යන්න පිළිබඳව වේ.

දෙපාර්ශවය විසින් විස්තර ප්‍රකාශ ගොණු කිරීමෙන් පසු මෙම කරුණ බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීමට හැකියාවක් නොතිබුණ හෙයින් 2020.08.21 වැනි දින විමසීම ආරම්භ කරන ලදී. එදින දෙවන පාර්ශවය නියෝජනය කරමින් මණ්ඩලයේ මානව සම්පත් නිලධාරී ඒ. ඩී. මිහිරානි මහත්මිය පෙනී සිටින ලදී. ඉල්ලුම්කරු හා ඔහු වෙනුවෙන් ඔහුගේ නියෝජිත ඒ. එම්. ජී. මයිකල් මහතා පෙනී සිටි අතර දෙවන පාර්ශවය වෙනුවෙන් රජයේ නීතීඥ ගංගානි උක්වත්තගේ මහත්මිය පෙනී සිටින ලදී. එදින ඉල්ලුම්කරු සාක්ෂි දෙමින් තමා 2012.12.12 වැනි දින ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කම්කරුවෙකු ලෙස බඳවා ගන්නා ලද බව ප්‍රකාශ කළේ ය. එය සනාථ කිරීම සඳහා අදාළ පත්වීම් ලිපිය A1 ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලදී. එම ලිපිය අනුව තමා මණ්ඩලයට බඳවා ගන්නා ලද්දේ කොන්ත්‍රාත් කම්කරුවෙකු ලෙස වසරක කාලසීමාවක් සඳහා බවත් එකී අවුරුද්දක් කාල සීමාව ඉකුත් වූ පසු කොන්ත්‍රාත් කාලය 2013.12.13 වැනි දින සිට තවත් වසරකින් දීර්ඝ කරන ලද බවත් ඉල්ලුම්කරු ප්‍රකාශ කළේ ය. එසේ සේවා කාලය දීර්ඝ කරන ලද ලිපිය A2 ලෙසත් ඊට අදාල කොටස A2(a) ලෙසත් ලකුණු කර ඉදිරිපත් කරන ලදී. එම සේවා කාලය නැවතත් 2014.12.12 වැනි දින සිට වසරකින් ඉල්ලුම්කරුගේ සේවය දීර්ඝ කිරීමේ ලිපිය A3 ලෙසත් එම ලිපියේ අඩංගු සේවා අවශ්‍යතාවය මත ඔබගේ කම්කරු සේවා කාලය 2014.12.13 වැනි දින සිට වසරක කාලයක් දීර්ඝ කරන ලද බව යනුවෙන් සඳහන් කොටස A3a ලෙසත් ලකුණු කර ඉදිරිපත් කරන ලදී.

මේ කාලය තුළ තමාට රුපියල් 19106ක මාසික දීමනාවක් හා ජීවන වියදම් දීමනාව ලැබුණු බවද ඉල්ලුම්කරු සඳහන් කළේ ය. එම වසර අවසාන වීමෙන් පසු තමාට කොන්ත්‍රාත් සේවා කාලය අඛණ්ඩව ඉදිරියට දීර්ඝ කරන ලද බව ප්‍රකාශ කළ ඉල්ලුම්කරු ඊට අදාල ලිපිය A4 ලෙසත් එම ලිපියේ අඩංගු "සේවයේ අවශ්‍යතාවය මත ඔබගේ කොන්ත්‍රාත් සේවා කාලය 2014.12.13 වැනි දින සිට අඛණ්ඩව" ඉදිරියට දීර්ඝ කරන ලද බවට වූ කොටස A4(a)ලෙසත් සලකුණු කර ඉදිරිපත් කරන ලදී. ඉල්ලුම්කරු වැඩිදුරටත් සාක්ෂි දෙමින් ප්‍රකාශ කළේ තමා සමග මණ්ඩලයට බඳවාගත් අනෙකුත් සේවකයන් ස්ථිර කළ ද තමාගේ සේවය ස්ථිර නොකළ බවත් වසර ගණනාවක් තමා ස්ථිර සේවකයෙකු විසින් කරනු ලබන කාර්‍යයන් ඉටු කළ ද ස්ථිර සේවකයෙකුට හිමිවන වරප්‍රසාද තමාට නොලැබෙන බවත්ය. තවද ඉල්ලුම්කරු සිය සාක්ෂියේ දී A5, A6, A7, A8, A9 යන ලේඛන ද සලකුණු කර ඉදිරිපත් කරන ලදී. A5 ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලද්දේ අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයක් අනුව අනියම්/කොන්ත්‍රාත් සේවක වැටුප් සංශෝධනයට අදාළ ඒ/3/චක්‍රලේඛ 1016 හා 2016.11.04 වැනි දින දරන චක්‍රලේඛයයි. ඒ අනුව අනියම් කම්කරු වැටුප රුපියල් 19106 සිට රුපියල් 27394 තෙක් වැඩි කර ඇත. A6 ලෙස ලකුණු කර ලද්දේ ඉල්ලුම්කරු ඇතුළු සේවකයින් පිරිසකගේ වැටුප් විෂමතා ඉවත් කිරීම යනුවෙන් කම්කරු කොමසාරිස් වෙත යවන ලද ලිපියකි. ඉල්ලුම්කරුගේ ඉල්ලීම අනුව අඹතලේ මල්ටි ප්ලාන්ට් අංශය භාර නිලධාරී නිකුත් කරන ලද ලිපිය A7 ලෙස සලකුණු කර ඉදිරිපත් කරන ලදී. එසේම ඉල්ලුම්කරු සිය රැකියාව ස්ථිර කර ගැනීම සඳහා කරන ලද ඉල්ලීමකට අදාළව නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය විසින් ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත 2018.09.06 දාතමින් එවන ලද ලිපියක් A8 ලෙස සලකුණු කරන ලදී. එහි සඳහන් වන්නේ රැකියාව ස්ථිර කර ගැනීම ඩී. වසන්තා ජයසිංහ මහත්මිය (මෙහි මහත්මිය ලෙස සඳහන් වුවත් එය ඉල්ලුම්කරුට අදාළ ලිපියක් නොවන බවට විරෝධයක් එල්ල නොවුණි.) එසේම ඉල්ලුම්කරු සිය සාක්ෂියේ දී A9 ලෙස සලකුණු කර ඉදිරිපත් කරන ලද්දේ මණ්ඩලයේ ප්‍රාදේශීය සේවා මධ්‍යස්ථානයේ කළමනාකරු ලංකා බැංකුවේ බත්තරමුල්ල ශාඛාවේ කළමණාකරු වෙත නිකුත් කරන ලද ලිපියකි. සේවය සනාථ කිරීම යනුවෙන් සඳහන් කර ඇති එම ලිපියේ සඳහන් වන්නේ ඉල්ලුම්කරු ප්‍රධාන ජල පවිත්‍රාගාරයේ කම්කරු තනතුරේ අඛන්ඩව සේවයේ යෙදී සිටින බවත් ඔහු 2027.07.04 වැනි දින සේවයෙන් විශ්‍රාම යාමට නියමිත බවත්ය. A10 ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලද ලේඛනය වන්නේ කළමණාකරු (ක්‍රියාත්මක) බටහිර නිෂ්පාදන විසින් 2020.02.13 වැනි දින නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත්) යොමු කරන ලද ලිපියකි. සේවය සනාථ කිරීම යනුවෙන් සඳහන් කර ඇති එම ලිපිය මගින් ඉල්ලුම්කරු ප්‍රධාන ජල පවිත්‍රාගාරයේ කම්කරු තනතුරේ සේවය කරන අතරතුර SPH පොම්පාගාරයේ පොම්ප ක්‍රියාකරවන සහායකයෙකු ලෙස එම රාජකාරී වලට සහය වන බවයි.

ඉල්ලුම්කරු සිය සාක්ෂියේ අවසානයේ දී ඉල්ලා සිටින ලද්දේ, (.................. දින කාර්යට සටහන්)

ප්‍ර : එතකොට තමුන් මේ ගරු අධිකරණයෙන් ඉල්ලා සිටින්නේ කුමක් ද සහනය?

උ : ස්ථිර සේවකයෙකුගේ වැටුප

ප්‍ර : ස්ථිර කම්කරුවන්ගේ වැටුපට සමාන කරන්න කියලද?

උ : ඔව්

ප්‍ර : ස්ථිර සේවකයින් ලබන දීමනා අතරින් තමන්ට නොලැබෙන දීමනා මොනවාද?

උ : වෛද්‍ය දීමනා ලැබෙන්නෙ නෑ

දෙවන පාර්ශවයේ ස්ථාවරය වන්නේ ඉල්ලුම්කරු ස්ථිර සේවකයෙකු නොවන බවයි. ඉල්ලුම්කරු ද ඒ බව පිළිගන්නා අතර ඉල්ලුම්කරුගේ සේවය ස්ථිර කළ බවක් ඉදිරිපත් කරන ලද ලේඛන වලින් සනාථ නොවේ. ඉල්ලුම්කරු සමග සේවයට බඳවා ගන්නා ලද අනෙකුත් සේවකයින් ස්ථිර කළ ද ඉල්ලුම්කරු සේවයේ ස්ථිර කිරීමට නොහැකි වී ඇත්තේ ඔහු සේවයට බඳවා ගන්නා විට වයස අවුරුදු 45 කට වැඩි පුද්ගලයෙකු වීම බවයි දෙවන පාර්ශ්වය ප්‍රකාශ කර සිටින්නේ. එම පාර්ශ්වය R11 ලෙස රාජ්‍ය පරිපාලන චක්‍රලේක අංක 20/2009 චක්‍රලේඛය ලකුණු කර ඉදිරිපත් කරන ලදී.

රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවයේ තාවකාලික අනියම් ආදේශක කොන්ත්‍රාත් සහ සහන පදනම මත බඳවාගත් ප්‍රාථමික ශ්‍රේණියේ සේවකයින් ස්ථිර කිරීමට අදාළ එම චක්‍රලේඛයේ සඳහන් කොන්දේසියක් වන්නේ එවැනි සේවකයෙකු ස්ථිර කිරීමට බඳවා ගන්නා දිනට වයසින් අවුරුදු 45ට වඩා අඩු විය යුතු වීමයි. එසේම දෙවන පාර්ශ්වය ප්‍රකාශ කරන ලද්දේ මණ්ඩලයේ ස්ථිර සේවකයින්ට වෙනම වැටුප් ක්‍රමයක් ද කොන්ත්‍රාත් සේවකයින්ට වෙනම වැටුප් ක්‍රමයක් ද ක්‍රියාත්මක වන බව යි. කොන්ත්‍රාත් සේවකයින්ගේ වැටුප ද වරින් වර වැඩි කරන ලද බව (ඉල්ලුම්කරුගේ සාක්ෂියේ දී සලකුණු කරන ලද A5 ලේඛනය අනුව ආරම්භයේ දී තිබූ රුපියල් 19106 ක වැටුප 2016.10.01 වැනි දින සිට රුපියල් 27394 දක්වා වැඩි වී ඇත.)

ඉල්ලුම්කරුගේ ප්‍රධාන ඉල්ලීමක් වන්නේ ස්ථිර සේවකයින්ට ගෙවන ඉතිරි වෛද්‍ය නිවාඩුවලට කරනු ලබන ගෙවීම තමන්ට නොලැබෙන බවයි. දෙවන පාර්ශ්වය පා 16/2015 මණ්ඩල චක්‍ර ලේඛයක් R12 ලෙස සලකුණු කර ඉදිරිපත් කරන ලදී.

එහි දැක්වෙන්නේ කොන්ත්‍රාත් පදනම මත සේවය කරන්නන්ට එම ගෙවීම සඳහා හිමිකම නොලැබෙන බවය.

මා වෙත යොමු කර ඇති ආකාරයට දෙපාර්ශවය අතර ආරවුලකට හේතු වී පවත්නා කරුණ වන්නේ ඉල්ලුම්කරු කොන්ත්‍රාත් සේවකයෙකු ලෙස රාජකාරී ඉටු කිරීමට පත්කර ඔහුගෙන් ස්ථිර සේවකයන් ඉටු කරන රාජකාරී ලබා ගත්ත ද ස්ථිර සේවකයන්ට ලැබෙන වරප්‍රසාද ලබා නොදීම තුළින් අසාධාරණයක් සිදු වී තිබේද යන්නයි.

කොන්ත්‍රාත් සේවකයෙකු ඉටු කරන රාජකාරිය කුමක්ද යන්න හා තීරණය කරන්නේ මණ්ඩලයේ පරිපාලනයයි. තමා කොන්ත්‍රාත් සේවකයෙකු බව පිළිගන්නා ගමන් ඔහුට ස්ථිර සේවකයෙකුගේ වරප්‍රසාද ඉල්ලා සිටීමේ හැකියාවක් නොමැති බව තීරණය කරමි. ඉල්ලුම්කරු සේවයේ ස්ථිර නොකිරීම මගින් ඔහුට අසාධාරණයක් සිදු වී තිබේද යන්න විමසා බැලීමට මා වෙත යොමු කර ඇති ආරවුලෙහි අඩංගු නොවේ. ඒ අනුව ඉල්ලුම්කරු කොන්ත්‍රාත් කම්කරුවෙකු ලෙස සේවයේ යෙදී සිටිමින් ස්ථිර සේවකයන්ට ලැබෙන වරප්‍රසාද ලබා නොදීමෙන් ඉල්ලුම්කරුට අසාධාරණයක් සිදු වී නොමැති බව තීරණය කරමි. ඒ අනුව ඉල්ලුම්කරුගේ ඉල්ලීම නිෂ්ප්‍රභා කරමි.

බේරුම්කරු,
නීතිඥ සරත් ලියනගේ.

2022 අගෝස්තු මස 14 වැනි දින.

EOG 09 - 0155

---

මගේ අංක - IR/COM/03/2018/123.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2019.06.13 දිනැති හා අංක 2127/27 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.06.06 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් හල්මිල්ලවැව, කොස්වත්ත, අංක 250 හි පදංචි එස්. ඒ. දයා කීර්ති බණ්ඩාර මයා සහ කොළඹ 03, ශාන්ත මයිකල් පාර, අංක 28, ලංකා බැංකු ගොඩනැගිල්ල, 17 වන මහලෙ හි පිහිටි මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.07.26 දිනැති ප්‍රදානය එම පනතේ 18 (1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 සැප්තැම්බර් මස 07 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව.
කොළඹ 05.

කොළඹ කාර්මික බේරුම්කරණයේ දී ය.

බේරුම්කරු - ඕබඩගේ ලීලාරත්න මැතිතුමා ඉදිරිපිටදී ය.

ගොනු අංකය : IR/COM/03/2018/123
බේරුම්කරණ අංකය : A/61/2019

එස්. ඒ. දයා කීර්ති බණ්ඩාර,
අංක 250,
කොස්වත්ත,
හල්මිල්ලවැව,

*පළමු පාර්ශ්වය*

*සහ*

මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා
ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී,

17 මහල,
ලංකා බැංකු ගොඩනැගිල්ල,
අංක 28,
ශාන්ත මයිකල් පාර,
කොළඹ 03

*දෙවැනි පාර්ශ්වය*

**අතර පවත්නා කාර්මික ආරවුල**

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ) ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

ආරවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,

"මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. ආයතනයේ සේවය කළ එස්. ඒ. දයා කීර්ති බණ්ඩාර මහතා විසින් ආයතනය වෙත ලබා දුන් ඉල්ලා අස්වීම නොපිළිගෙන විනය පරීක්ෂණයක් පවත්වා එම විනය පරීක්ෂණ තීරණය ලබා නොදී ආයතනයෙන් ඉල්ලා අස් වූ සේවකයෙකු ලෙස සැලකීම තුළින් එස්. ඒ. දයා කීර්ති බණ්ඩාර මහතාට අසාධාරණයක් සිදු වී තිබේ ද? එසේ අසාධාරණයක් සිදු වී තිබුණේ නම් ලබා දිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ."

පෙනී සිටීම -
පළමුවන පාර්ශ්වය වෙනුවෙන් නීතිඥ ඉන්ද්‍ර ලද්දුවහෙට්ටි මහතා පෙනී සිටී.

දෙවැනි පාර්ශවය වෙනුවෙන් මානව සම්පත් කළමණාකාරිණී ලලනි කරුණාරත්න මහත්මිය පෙනී සිටි අතර,

දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් නීතිඥ කියාති වික්‍රමනායක මෙනෙවිය සමග නීතිඥ සුරේන් ප්‍රනාන්දු මහතා පෙනී සිටී.

පසුබිම

මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. ආයතනයේ කුරුණෑගල ශාඛාවේ කළමණාකරු ලෙස සේවය කරමින් සිටියෙදී එස්. ඒ. දයා කීර්ති බණ්ඩාර මහතා 2014.05.08 දිනැති ලිපිය මගින් 2014 ජුනි මස 09 වැනි දින් සිට කිරිබත්ගොඩ ශාඛාව වෙත ස්ථාන මාරුවීමක් සිදුකර ඇත. ( A1 ).මේ සම්බන්ධයෙන් තමාට නව සේවා ස්ථානයට යාම සඳහා මාස තුනක කාලයක් ලබාදෙන ලෙසට ඉල්ලුම්කරු විසින් ඉල්ලීමක් කර තිබුනද ( A2 ) එම ඉල්ලීම කළමනාකාරීත්වය විසින් ප්‍රතික්ෂේප කර ඇත. මේ හේතුව මත ඉල්ලුම්කාර දයා කීර්ති බණ්ඩාර මහතා තමාගේ සේවයෙන් ඉවත් වීමේ ලිපිය 2014.05.28 දාතමින් යුත් ලිපිය මගින් ලබා දී ඇති අතර, 2014 අගෝස්තු මස 28 වැනි දින සිට තමා සේවයෙන් ඉල්ලා අස්වන බවට දැනුම්දී ඇත. (A3). ඉන් අනතුරුව 2014.06.02 දිනැති ( A4 ) ලිපිය මගින් තමාට සේවා සහතිකයක් ලබාදෙන ලෙසට ඉල්ලීමක් සිදුකර ඇති අතර, A6 ලේඛනය මගින් ඉල්ලුම්කරුගේ ඉල්ලා අස්වීම පිළිගත නොහැකි බවට සේවායෝජක විසින් දැනුම් දී ඇති අතර ඔහුට එරෙහිව විනය පරීක්ෂණයක් සඳහා කැඳවීමක් සිදු කර ඇත. මේ අතරතුර තමා විසින් ලබාගෙන ඇති වාහනය වෙනුවෙන් ගෙවිය යුතු මුදල තම පාරිතෝෂිකයෙන් අඩුකර ගෙන එම ණය මුදල පියවා ගන්නා ලෙසට ද ඉල්ලීමක් සිදු කර ඇත. එහෙත් සමාගම එයද පිළිගෙන නොමැත. කෙසේ වෙතත් ඉල්ලුම්කාර දයා කීර්ති බණ්ඩාර මහතා විසින් 2016.10.18 දාතමින් යුතුව තමාට සිදු වී ඇති අසාධාරණය සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වන ලෙසට දැනුම් දී ඇත. මේ අතරතුර ඉල්ලුම්කරු විසින් කම්කරු කොමසාරිස් (කාර්මික සම්බන්ධතා) වෙත කරන ලද පැමිණිල්ලකට අනුව මෙම ආරවුල නිරවුල් කිරීම සඳහා බේරුම්කරණය වෙත යොමුකර ඇත.

**ප්‍රදානය**

දැන් මෙම බේරුම්කරණයට යොමු වී ඇති කරුණ සම්බනධයෙන් ඉදිරිපත් වූ ලිඛිත හා වාචික සාක්ෂි පිළිබඳව අවධානය යොමුකරමින් යුක්ති සහගත හා සාධාරණ තීරණයක් ලබාදීම බේරුම්කරු වන මාගේ යුතුකම වේ. මෙහි දී දෙවැනි පාර්ශ්වය විසින් දක්වා ඇති විරෝධතාවය වන මෙම ආරවුල බේරුම්කරණයෙන් සමතයකට පත් කිරීම සඳහා අධිකරණ බලයක් නොමැතිය යන කරුණ සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම ඉතාමත් වැදගත් වන්නේ මෙම බේරුම්කරණ ප්‍රදානය ලබා දීමේ දී එය ඉතා වැදගත් සාධකයක් වන බැවිනි. කෙසේ වෙතත් සේවා යෝජක විසින් ඉදිරිපත් කර ඇති බොහෝ කරුණු ඉතා වැදගත් වන අතර ඒ සම්බන්ධයෙන් මාගේ විශේෂ අවධානය යොමු කළෙමි. ප්‍රථමයෙන් ම මෙම බේරුම්කරණයට යොමුකර ඇති ආරවුලෙහි යොමුව කෙරෙහි මාගේ අවධානය යොමු කලෙමි. එනම්,

"මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. ආයතනයේ සේවය කළ එස්. ඒ. දයා කීර්ති බණ්ඩාර මහතා විසින් ආයතනය වෙත ලබා දුන් ඉල්ලා අස්වීම පිළි නොගෙන විනය පරීක්ෂණයක් පවත්වා එම විනය පරීක්ෂණ තීරණය ලබා නොදී ආයතනයෙන් ඉල්ලා අස් වූ සේවකයෙකු ලෙස සැලකීම තුළින් එස්. ඒ. දයා කීර්ති බණ්ඩාර මහතාට අසාධාරණයක් සිදු වී තිබේද? එසේ අසාධාරනයක් සිදු වී තිබුණේ නම් ලබාදිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ."

මෙහිදී විශේෂයෙන්ම මාගේ අවධානය යොමු කරනු ලැබුවේ මෙම යොමුවට අනුව යම් අසාධාරණයක් මෙම සේවකයාට සිදු වී ඇත්ද යන්නයි. ඒ සම්බන්ධයෙන් තීරණය කිරීමේ දී විශේෂයෙන්ම මෙම සේවකයා තමාගේ සේවය අවසන් වීම හෝ අවසන් කිරීම සිදුවූයේ කවදා ද යන්න පිළිබඳව තමන් දැරූ ස්ථාවරය කුමක් ද යන්න සොයා බැලිය යුතු වේ. ඒ අනුව මෙසේ සේවකයා තමාගේ සේවය අවසන් වූ දිනය සම්බන්ධයෙන් දැරූ ස්ථාවරයන් අවස්ථා කිහිපයක දීම එක හා සමාන වීම කෙරෙහි මාගේ අවධානය යොමු කළෙමි. ප්‍රථමයෙන්ම මෙම සේවකයා විසින් සේවායෝජක වෙත යොමු කරවනු ලැබූ තමා සේවයෙන් ඉල්ලා අස් වීමේ ලිපිය එනම් ( A3 ) (ගොනුවේ පිටු අංක 289) ආයතනය වෙත යොමු කර ඇත්තේ තමා කිරිබත්ගොඩ ශාඛාවට ස්ථාන මාරු කිරීම සම්බන්ධයෙන් වූ ලිපිය ( A1 ) ට පිළිතුරු වශයෙක් ස්ථාන මාරුව ජූලි මස 31 දක්වා කල් දමන ලෙසට කරන ලද ලිපියට පිළිතුරු වශයෙන් එම කල් ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම හේතුකොට

ගෙන වේ. ඉන්පසු මෙම සේවකයා කිහිප අවස්ථාවකදීම තමාට සේවා සහතිකයක් ලබා දෙන ලෙසට ඉල්ලීම් කර ඇත. ( A4, A7 ). ආයතනය විසින් මෙම ඉල්ලීම් ප්‍රතික්ෂේප කර ඇත්තේ ඔහුට එරෙහිව විනය පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කර ඇති බව පවසමිනි. පසුව සේවා යෝජක ආයතනය විසින් ඔහු වෙත යොමු කරන ලද 2014.09.16 දිනැති නිදහසට කරුණු විමසීමේ ලිපිය සම්බන්ධයෙන් ඉල්ලුම්කරු විසින් යොමු කර ඇති 2014.09.22 දිනැති පිළිතුරු ලිපිය ( A8) කෙරෙහි මාගේ අවධානය යොමු කළෙමි. එහි පළමු ඡේදය පහත පරිදි වේ.

"2014.05.28 දිනැති ඔබවෙත භාරදුන් මාගේ අස්වීමේ ලිපියට අනුව 2014.08.28 වැනි දිනෙන් පසු MCSL ආයතනය තුළින් මාගේ සේවය අවසන් වී ඇති බවත් මා තවදුරටත් MCSL ෆයිනෑන්ස් සර්විස් ආයතනයේ සේවකයෙකු නොවන බවත් ඔබතුමා වෙත ඉතා කරුණාවෙන් මතක් කර දීමට කැමැත්තෙමි. එසේ වුවද අවුරුදු 15 කටත් වඩා වැඩි කාලයක් MCSL ආයතනයේ සේවය කළ මා ඔබතුමා විසින් එවන ලද Show cause Notice එකට පිළිතුරක් ලබා දී මාගේ නිර්දෝෂීභාවය තහවුරු කිරීම යුතුකම මෙන්ම සදාචාර සම්පන්න ක්‍රියාවක් ද වන බැවින් මෙම පිළිතුරු ලිපිය ඔබ වෙත යොමු කිරීමට තීරණය කලෙමි."

මෙම ලිපිය මගින් ඉල්ලුම්කාර සේවකයා විසින් තමා 2014.08.28 දින ආයතනයේ සේවයෙන් ඉවත් වී ඇති බව තහවුරු කිරීමක් සිදුකර ඇත.

තවදුරටත් A 17 (ගොනුවේ පිටු අංක 329) මගින් කුරුණෑගල සහකාර කම්කරු කොමසාරිස්වරයා වෙත පැමිණිල්ලක් යොමු කරමින් තමා සම්බන්ධයෙන් විනය පරීක්ෂණයක් පැවැත්වූ ද එහි ප්‍රතිඵල ලබා නොදුන් බවටත්, තමා කිහිප අවස්ථාවකදී ම සේවා සහතිකයක් ඉල්ලා සිටි නමුදු එසේ සේවා සහතිකයක් ලබා නොදුන් බවටත් තමාගේ ETF, EPF සහ පාරිතෝෂික දීමනා මේ වන තෙක් ලබා නොදුන් බවට ද දක්වා මේ පිළිබඳව සාධාරණයක් ඉටුකර දෙන මෙන් ඉල්ලීමක් සිදුකර ඇත.

මේ අනුව කුරුණෑගල සහකාර කම්කරු කොමසාරිස්වරයා විසින් පරීක්ෂණයක් පවත්වා එම පරීක්ෂණය සම්බන්ධයෙන් තම නිගමනයන් සේවායෝජක වෙත දන්වා ඇත. ( A 330 ) (ගොනුවේ පිටු අංක 348). එම ලිපිය මගින් සහකාර කම්කරු කොමසාරිස්වරය විසින් සිය ලිපියේ 3 වන ඡේදය මගින් මෙසේ දක්වා ඇත.

"03. පැමිණිලිකරු 2014/05/28 දිනෙන් පසු සේවයේ යෙදී ඇති බවක් ඉදිරිපත් කර ඇති කරුණු සැලකිරීම් මගින් ද හෙළිදරව් නොවේ. ඒ අනුව ඔහුට හිඟ වැටුප් අය කර දීමේ ප්‍රතිපාදන නොපවතී " යනුවෙන් දක්වා ඇත.

මෙම සහකාර කම්කරු කොමසාරිස්වරයාගේ ලිපිය පළමු පාර්ශවය විසින්ම A33 ලෙසට සලකුණු කර (ගොනුවේ පිටු අංක 349) ඉදිරිපත් කර ඇති අතර, එම ලිපියේ සේවය අවසන් කර ඇති දිනය සම්බන්ධයෙන් කිසිදු විරෝධතාවයක් සිය සාක්ෂි මගින් සිදු කර නොමැත.

තවද, සේවා යෝජක පක්ෂය විසින් මෙම ගරු බේරුම්කරණයට ඉදිරිපත් කරමින් R 3 (ගොනුවේ පිටු අංක 264) (පළමු පාර්ශ්වය විසින් A33 ලෙසට සලකුණු කර ගොනුවේ පිටු අංක 348 අමුණා ඇත.) ලෙසට සලකුණු කරන ලද 2018.01.08 දිනැති කුරුණෑගල දිස්ත්‍රික් කම්කරු කොමසාරිස් කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස්වරයාගේ Kuru/A/437/2016 අංක දරන නිවේදනය මගින් සේවා යෝජක වෙත මෙම බේරුම්කරණ නඩුවේ ඉල්ලුම්කරු වන දයා කීර්ති බණ්ඩාර මහතා වෙත පාරිතෝෂික වශයෙන් අධිභාර මුදල ද සමගින් රුපියල් 1,246,537.50 (රුපියල් දොළොස් ලක්ෂ හතළිස් හයදහස් පන්සිය තිස්හතයි ශත පනහ) ක මුදලක් සිය කාර්යාලයේ තැම්පත් කරන ලෙසට දන්වා යවා ඇති අතර, සේවායෝජක විසින් මෙම බේරුම්කරණය වෙත ඉදිරිපත් කරන ලද R4 දරන චෙක්පත (ගොනුවේ පිටු අංක 265) (චෙක්පත් අංක 172062 හා 2018.03.12 දරන) මගින් කුරුණෑගල සහකාර කම්කරු කොමසාරිස්වරයා වෙත එකී මුදල තැන්පත් කර ඇත.

එකී පාරිතෝෂික මුදල සම්බන්ධයෙන් සේවායෝජක පක්ෂය වන දෙවන පාර්ශ්වය විසින් පළමු පාර්ශ්වයේ සේවකයා වන දයා කීර්ති බණ්ඩාර මහතාගෙන් හරස් ප්‍රශ්න විමසීමේ දී පහත පරිදි පිළිතුරු සපයා ඇත.

2022.07.29 දින සාක්ෂි සටහන්වල පිටු අංක 23 (ගොනුවේ පිටු අංක 155)

"ප්‍ර. එතකොට දැන් පාරිතෝෂික දෙන්නේ තමුන් දන්නවා සේවය අවසන් වුනාම?

උ. සේවය අවසන් වුණාම පාරිතෝෂික ලබාදෙන්නේ කියලා දන්නවා."

2020.07.29 වැනි දින සාක්ෂි සටහන්වල පිටු අංක 37 (ගොනුවේ පිටු අංක 169)

"ප්‍ර. මේ ආර් - 3 කියන ලේඛනයට අනුව සඳහන් වෙලා තියෙනවා තමන් සේවයට බැඳුනේ 1999.08.02 වැනි දින කියල

උ. එහෙමයි ස්වාමිණී

ප්‍ර. ඒ වගේම අවසන් වශයෙන් සේවය කරපු දිනය වශයෙන් 2014.08.28 වැනි දින කියල.

උ. ඉල්ලා අස්වීම ලබාදීල තියෙනව"

මෙම ඉල්ලුම්කාර සේවකයා තමන්ට හිමි පාරිතෝෂික මුදල කුරුණෑගල කම්කරු කාර්යාලයෙන් ලබාගෙන ඇති අතර, එම මුදල 30% ක අධිභාරය ද සමග ලැබුණු බවට ද සාක්ෂි ලබා දී ඇත.

මෙම ඉල්ලුම්කරු කිසිදු අවස්ථාවක තම සේවය අවසන් වූ දිනය සම්බන්ධයෙන් හබ කර නොමැත. ඔහු තම බේරුම්කරණ යොමුවෙන් ද ඉල්ලා සිටින්නේ ඉල්ලා අස්වීමේ ලිපිය පිළිගත් බවට දැනුම් දීමක් කර නොතිබීම සම්බන්ධයෙනි. එහෙත් ඔහු තම ඉල්ලා අස්වීමේ දිනය 2014.08.28 වැනි දින බවට පිළිගෙන ඇති අතර ඔහු සේවා සහතික ඉල්ලීම් කර ඇත්තේ ද වෙනත් රැකියාවකට යාමේ අපේක්ෂාවෙන් බවද තහවුරු වේ. සේවකයෙකු සේවයෙන් ඉවත් වීම සිදුවනුයේ ප්‍රධාන කරුණු 2 ක් පදනම් කරගෙන වේ. එනම් සේවකයා සේවයෙන් භෞතිකව ඉවත්වීම කළ යුතු අතර, නැවත සේවයට පැමිණීමට ඔහු හට අපේක්ෂාවක්

නොවන බවට එනම් සේවකයාගේ සේවයෙන් ඉවත්ව යාමට ඇති චේතනාව (Mental Intention) තහවුරු විය යුතුය.

මෙම ඉල්ලුම්කරු තමන්ගේ ඉල්ලා අස්වීමේ දිනය පිළිබඳ කිසිදු හබ කිරීමක් සිදුකර නොමැතිවා පමණක් නොව නිදහසට කරුණු විමසීමේ ලිපියට පිළිතුරු සපයමින් ස්ථිරවම පවසා ඇත්තේ තමා 2014.08.28 දිනෙන් පසු මෙම ආයතනයේ සේවකයෙකු නොවන බවයි. එමෙන්ම ඔහුගේ පැමිණිල්ලකට අනුව කුරුණෑගල දිස්ත්‍රික් කම්කරු කොමසාරිස්වරයා විසින් පාරිතෝෂික ගණනය කිරීමේ දී ද සේවකයා සේවයක් ඉල්ලා අස්වූ දිනය වන 2014.08.28 දිනය සලකා ඇති අතර ඒ සම්බන්ධයෙන් ඉල්ලුම්කාර සේවකයා කිසිදු අවස්ථාවක විරෝධතාවයක් පළකර නොමැත. තවද සිය බේරුම්කරණ යොමුවෙන්ද සේවය අවසන්වීමේ දිනය සම්බන්ධයෙන් හබකර නොමැත. ඔහු හබ කරනුයේ තම ඉල්ලා අස්වීම පිළිගත් බවට ලිඛිතව දන්වා නොතිබීම මෙන්ම තමන්ට එරෙහිව පවත්වන ලද විනය පරීක්ෂණයෙහි ප්‍රතිඵල තමන්ට ලබා නොදීම සම්බන්ධයෙන් පමණකි. අනික් අතට සේවකයා සිය ඉල්ලා අස්වීම ලබාදුන් පසු ආයතනයට ඒ සම්බන්ධයෙන් ඔහුට එරෙහිව ගත හැකි ක්‍රියා මාර්ග ඉතා අල්ප වේ. එනම් සේවා ගිවිසුම කඩ කිරීම සම්බන්ධයෙන් වන සිවිල් නඩුවක් ගොනුකිරීම පමණක් වේ. මෙම කරුණු සියල්ල සලකා බැලීමේ දී සේවකයා තමා සේවයෙන් ඉවත්වීම 2014.08.28 බවට මනාව තහවුරු කර ඇත. ඒ අනුව ඔහුගේ සේවයෙන් ඉවත්වීමට ඇති චේතනාව (Mental Intention) පැහැදිලිවම තහවුරු වී ඇත.

ඉහත කරුණු සියල්ල සලකා බැලීමේ දී මෙම ඉල්ලුම්කරු මුල සිටම තමන්ගේ සේවය 2014.08.28 දින සිට අවසන් වූ බවට පැහැදිලි ස්ථාවරයක සිට ඇත. එය වඩාත් තහවුරු වන්නේ නිදහසට කරුණු දැක්වූ ලිපියෙහි මුල් ඡේදයෙන්ම තමා 2014.08.28 දින සිට ආයතනයේ සේවකයෙකු නොවුවද තමන්ගේ නිදොස් බව ඔප්පු කිරීම සඳහා පිළිතුරු සපයන බව ප්‍රකාශ කිරීමෙනි. මේ අනුව ඉතාමත් පැහැදිලිව මෙම සේවකයාගේ සේවය 2014.08.28 දින අවසන් වී ඇති බවත් ඒ අනුව ඔහුට හිමි ව්‍යවස්ථාපිත හිමිකම් හා අනෙකුත් හිමිකම් සම්බන්ධයෙන් කම්කරු දෙපාර්තමේන්තුවේ කුරුණෑගල කාර්යාලයට පැමිණිලි කර ඇති බවත්, එම පැමිණිල්ලේ දී ඔහුට හිමි පාරිතෝෂිකය ගණනය කර ඇති බවත් මනාව තහවුරු වන කරුණු වේ. තව ද මෙම පැමිණිල්ල සමතයකට පත්වීමට තවත් ඉල්ලීම් කිහිපයක් ඉදිරිපත් කළ බවත් එම ඉල්ලීම්වලින් සමහර ඉල්ලීම්වලට සේවායෝජක පක්ෂය එකග වූ බව පැවසුව ද ඒ සම්බන්ධ කිසිදු සාක්ෂියක් මෙම බේරුම්කරණයට ඉදිරිපත් නොකළ බවත් සැලකිල්ලට ගතිමි.

ඒ අනුව මෙම සේවකයාගේ සේවය 2014.08.28 වැනි දින අවසන් වීම (සේවකයා විසින්ම එය තහවුරු කිරීම හේතුකොට ගෙන) යන්න සලකා බැලීමේ දී ඉන් අනතුරුව ඉදිරිපත් වී ඇති විනය පරීක්ෂණයක ප්‍රතිඵල ලබා නොදීම සම්බන්ධයෙන් කිසිද ප්‍රදානයක් කිරීමට මෙම ගරු බේරුම්කරණයට බලයක් නොමැති අතර ඒ හේතුව මත එනම් විනය පරීක්ෂණයේ තීරණය ලබා නොදී 2014.08.28 වැනි දින සිට තමා සේවයෙන් ඉල්ලා අස් වූ බව පිළිගැනීමෙන් ඔහුට බලවත් අසාධාරනයක් හා මූල්‍යමය පාඩුවක් සිදු වී ඇති බවට කිසිදු සාක්ෂියක් හෝ ලේඛන මගින් මෙම බේරුම්කරණ නඩුවේ දී තහවුරු කර නොමැති අතර අවම වශයෙන් ඒ සම්බන්ධයෙන් කිසිදු සාක්ෂියක් හෝ ඉදිරිපත් කර නොමැති බැවින් ඒ සම්බන්ධයෙන් ද ප්‍රදානයක් සිදු කළ නොහැකි වේ. ඉල්ලුම්කාර සේවකයා විසින් තමාට වෙනත් රැකියාවකට යාමට ඇති අවස්ථාව ගිලිහී ගිය බවට සිය සාක්ෂියේ දී පැවසුව ද ඒ බව සනාථ කිරීමට වෙනත් කිසිම සාක්ෂිකරුවකු හෝ ලේඛනයක් හෝ ඉදිරිපත් කිරීමට අපොහොසත් වී ඇත.

අනික් අතට වැදගත්ම කරුණ වනුයේ දෙවැනි පාර්ශවය විසින් සිය විරෝධය දක්වා ඇති ආකාරයටම මෙම ආරවුල කාර්මික ආරවුල් පනතේ 3(1) වගන්තිය යටතේ කාර්මික ආරවුලක් යන්නට ඇතුළත් වන්නේද? එම ආරවුල සජීවී ආරවුලක් ද? යන්න හා මෙම ආරවුල කාර්මික ආරවුල් පනතේ 4(1) යටතේ බේරුම්කරණයට යොමුකල හැකි ආරවුලක් ද? යන්න විමසා බැලීම වේ.

මෙම ඉල්ලුම්කරුගේ සේවය අවසන්වී ඇත්තේ (ඉල්ලුම්කරු විසින් තහවුරු කරන ආකාරයට) 2014-08-28 දින වන අතර, 2016 දී සහකාර කම්කරු කොමසාරිස් කුරුණෑගල වෙත පැමිණිල්ලක් කර ඇති අතර, එම අවස්ථාවේදී හෝ තම සේවය අවසන්වී නොමැති බවට හෝ තම සේවය අසාධාරණ ලෙස අවසන්කර ඇති බවට හෝ කිසිදු ඉල්ලීමක් හෝ කම්කරු කොමසාරිස් (කාර්මික සම්බන්ධතා) වෙත කරන ලද පැමිණිල්ල බේරුම්කරණයට යොමු කිරීමේදී සේවය අවසන්වූ දිනය පිළිබඳව හබ කිරීමක් සිදුකර නොමැති බැවින් සේවය අවසන්වූ සේවකයකුගේ සේවය අවසන් කිරීමට අදාළ කරුණක් සම්බන්ධයෙන් හැර වෙනත් කරුණක් සම්බන්ධයෙන් කාර්මික ආරවුලක් පැන නැගිය නොහැකි බැවින්. මෙම ඉල්ලීම් සිදුකර ඇත්තේ සේවය අවසන් වී දිගු කලකට පසුව වන බැවින් මෙය සජීවී ආරවුලක් ලෙසට සැලකීමට හැකියාවක් නොමැත. තවද, මෙම සේවකයා දෙවැනි පාර්ශවය වන සේවා යෝජක විසින් ඉදිරිපත් කර ඇති නිදහසට කරුණු විමසීමේ ලිපියට පිළිතුරු දීමේ සිටම තමා සේවයෙන් ඉවත් වූ සේවකයකු බවට තහවුරු කරමින් කටයුතු කර ඇති නිසා සේවයෙන් ඉවත්වූ සේවකයකුට එරෙහිව කරන ලද විනය පරීක්ෂණයක් හේතුකොට ගෙන කාර්මික ආරවුලක් පැන නැගීමට කිසිසේත්ම ඉඩකඩ නොමැති බවට තීරණය කරමි. එබැවින් විනය පරීක්ෂණයේ ප්‍රතිඵල ලබානොදී තමාගේ සේවය 2014-08-28 අවසන්වූ බවට සැලකීමෙන් මෙම සේවකයා හට කිසිදු අසාධාරණයක් සිදුවී ඇති බවට පළමු පාර්ශවය විසින් කිසිදු සාක්ෂියක් මගින් තහවුරු කර නොමැත. ඒ අනුව කාර්මික ආරවුල් පනතේ ප්‍රතිපාදන අනුව මෙම ආරවුල බේරුම්කරණයට යොමුකල හැකි ආරවුලක් නොවන බවට තීරණය කරමි. ඒ අනුව මෙම ආරවුල බේරුම්කරණය මගින් සමත කරමින් ප්‍රදානයක් ලබාදීමේ අධිකරණ බලයක් මෙම බේරුම්කරණයට නොමැති බවට තීරණය කරමි.

### ප්‍රදානය

මෙම ආරවුල බේරුම්කරණයෙන් සමත කිරීම සඳහා හෝ බේරුම්කරණ ප්‍රදානයක් ලබාදීම සඳහා මෙම බේරුම්කරණයට අධිකරණ බලයක් නොමැති බැවින් ඉල්ලුම්කරුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කරන අතර, ගොනුව අවසන් කිරීමට කටයුතු කරමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බවට තීරණය කරමි.

බේරුම්කරු

2022 ජූලි මස 26 වැනි දින දී ය.

EOG 09 - 0156

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.